**ජනනි ජයතිලක**
ව්‍යාපෘති සහකාර, තොරතුරු තාක්ෂණ
වාහන වායු විමෝචන වැඩසටහන

# "විෂ දුමෙන් තොර ලොවක් - සුවබර හෙටක්" වෙනුවෙන් වාහන වායු විමෝචන වැඩසටහන

## 1. හැඳින්වීම

සියලු ජීවීන්ගේ මූලික අවශ්‍යතාවයක් ලෙස අප අවට ඇති වාතය හැඳින්විය හැකි වුවත් එය අප අතර ඇති සම්පතක් ලෙස සලකනු ලැබුවේ ඉතා අල්ප ලෙසය. කෙසේ වෙතත් ලෝකයේ බොහෝ රටවල්වල මෙන් ශ්‍රී ලංකාව තුළ වර්ධනය වන ප්‍රශ්නයක් ලෙස අප අවට අසීමිතව ඇති වාතය මිනිස් ක්‍රියාකාරම්වල බලපෑම නිසා අපිරිසිදු වීම සිදුවීමත් සමඟ වායු දූෂණය සිදු වන බව මේ වන විට හඳුනාගෙන තිබේ.

නාගරික වාතයේ ගුණාත්මකභාවය ආසියාවේ වර්ධනය වන ගැටළුවක් වන අතර නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල අවට පරිසරයේ (එළිමහන් වායු දූෂණය) 2012 දී ලොව පුරා මිලියන 3.7ක මරණ සංඛ්‍යාවක් වාර්තා වී ඇති බව ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රකාශිත වාර්තා ගත වේ. ආසියානු නගරවල ඇතිවන වායු දූෂණය පිළිබඳ හඳුනාගත් ජංගම මූලාශ්‍ර ලෙස මෝටර් වාහනවලින් සිදුවන විමෝචනයන් ප්‍රධානව ඇතුළත් වේ.

කොළඹ නාගරික ප්‍රදේශවල වායු දූෂණය වැඩිවීමේ ගැටළුව හඳුනා ගැනීමත් සමඟ ලෝක බැංකු ආධාර යටතේ ශ්‍රී ලංකා රජය විසින් 1993 වර්ෂයේදී වායු තත්ත්ව කළමනාකරණය පිළිබඳ පිරිසිදු වායු 2000 ක්‍රියාකාරී සැලැස්ම (Clean Air 2000 Action Plan) ප්‍රකාශයට පත් කරන ලදී. නාගරික පරිසරය වැඩිදියුණු කිරීමේ වැඩසටහන (Metropolitan Environment Improvement Programme) යටතේ වායු විමෝචනය අඩු කිරීමේ සංරචක යොදා ගනිමින් ශ්‍රී ලංකාව තුළ වාතයේ ගුණාත්මකභාවය පිළිබඳ සැලකිලිමත් විය යුතු ආකාරය මෙම ක්‍රියාකාරී සැලැස්මේ උපාය මාර්ග ලෙස ඉදිරිපත් කර ඇත. (AirMAC,2014) විවිධාකාර ක්ෂේත්‍ර ඔස්සේ සමස්ත ප්‍රතිපත්ති සම්පාදන රාමුව මඟින් හඳුන්වා දිය යුතු ප්‍රතිපත්ති හා උපායමාර්ග මෙම සැලැස්මේ අන්තර්ගත වී තිබේ. ඒ අතර;

- වාහන පරීක්ෂා කිරීම සහ නඩත්තු කිරීම
- ඉන්ධන සංයුතිය හා එහි මිල ගණන් සහ වාහන ගහනයේ සංයුතිය
- වායු විමෝචන දත්ත ගබඩා කිරීම, අධීක්ෂණය සහ අවම කිරීම
- සම්මත ප්‍රමිති සැකසුම
- ආයතනික රාමුව සහ නියාමන අනුකූලතාවය
- ආර්ථික මිනුම් උපකරණ
- ප්‍රවාහන සැලසුම් හා රථවාහන කළමනාකරණය

ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් නාගරික වායු දූෂණය සිදුවන්නේ මාර්ගගත මෝටර් රථවලින් සිදුවන වායු විමෝචනය මඟිනි. ප්‍රමිතිය අඩු කිරීම, නිසි ප්‍රමිතියකින් තොරව වායු විමෝචනය නියාමනය සහ නිසි ප්‍රමිතීන් වලින් නොමැති වාහනවල භාවිතය, කොළඹ හා ප්‍රධාන නගරවල

වැඩි වශයෙන්ම වාතයේ ගුණාත්මකභාවය දුර්වල වීමට හේතු වී ඇත. මෙය මහජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයන් පිරිහීමට හා ජීවන තත්ත්වයන් පහත දැමීමට හේතු වී තිබේ.

එබැවින් වායු විමෝචනයන් අඩු කිරීම හා පාලනය කිරීම සඳහා පුළුල් උපායමාර්ග අවශ්‍ය වන අතර ඒ සඳහා නව වාහන සඳහා වායු විමෝචන ප්‍රමිතීන්, පිරිසිදු ඉන්ධන, දැනට භාවිතා කරන රථවාහන සඳහා පරීක්ෂණ සහ නඩත්තු වැඩසටහන්, වාහන ආනයනකරණ ප්‍රතිපත්ති, රථවාහන තදබදය හා ඉල්ලුම කළමනාකරණය මෙන්ම ආයතනික මට්ටමේ ධාරිතා සංවර්ධනය කිරීම, අධ්‍යාපනය සහ පුහුණුව ආදිය ඇතුළත් විය යුතු වේ. ක්‍රමයෙන් වැඩිවන වායු දූෂණයේ බලපෑම පිළිබඳ අවබෝධය සහිතව පරිසරයට හා එහි වෙසෙන සියලුම ජීවීන්ට ඇතිවන හානි අවම කිරීමේ අරමුණින් ප්‍රධාන පාර්ශවකරුවන් ලෙස ප්‍රවාහන අමාත්‍යාංශයත්, මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවත්, පරිසර අමාත්‍යාංශයත්, මිනුම් ඒකක හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුවත්, මධ්‍යම පරිසර අධිකාරියේත් සහයෝගය ඇතිව වාහන වායු විමෝචනය පරීක්ෂා කිරීම සඳහා මෙම වැඩසටහන ආරම්භ කරන ලදී.

1994 වර්ෂයේදී සංසරණ වායු හා වායු විමෝචන ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට නිර්දේශ ඉදිරිපත් වුව ද, වාහනවලින් පිටවන දූෂ්‍යකාරක නිසා නාගරික ප්‍රදේශයන් තුළ වාහන වායු දූෂණය සිදුවන බවත් එමඟින් පුරවැසියන්ට හුස්ම ගැනීමට පිරිසිදු වාතය නොමැතිවීම නිසා මූලික මානව හිමිකම් කඩවන බවත් සඳහන් කර වාහන සඳහා වායු විමෝචන ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කරන ලෙස පරිසර අමාත්‍යතුමාට නියෝග කරන ලෙස ඉල්ලා ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන වගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක 569/98 දරණ පෙත්සම ගොනු කරන ලදී. එම පෙත්සම පංච පුද්ගල විනිසුරු මණ්ඩලයක් විසින් 1999 වර්ෂයේ විභාග කරන ලද අතර වාහන වායු විමෝචන ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කරන ලෙස පරිසර අමාත්‍යතුමාට නියෝග කරන ලදී.

ඒ අනුව 2000 වර්ෂයේදී වාහනවලට වායු විමෝචන ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කරන ලද අතර එම නියෝගවල වායු විමෝචන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ බලධාරියා ලෙස මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා නම් කරන ලදී. ඉන් අනතුරුව මෙම වැඩසටහන ආරම්භ කිරීම සඳහා මූලික සාකච්ඡා සියළුම පාර්ශවකරුවන් සමඟ පරිසර අමාත්‍යාංශයේ වායු සම්පත් කළමනාකරණ කේන්ද්‍රයේ දී පවත්වන ලද අතර එම සාකච්ඡාවලදී ගත් තීරණ අනුව භාවිතා කරන වාහනවල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා සමීක්ෂණයක් පවත්වන ලදී. එහිදී විශාල ලෙස වාහන අසමත් වූ හෙයින් ආරම්භයේදීම මෙම වැඩසටහනට මහජනතාවගෙන් විරෝධතාවයන් මතු වීම වළක්වාලීම සඳහා 2003 නව ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කරන ලදී. එම ගැසට් පත්‍රය මඟින් 2004 හා 2007 වර්ෂවලදී ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමට ඉදිරිපත් කළ ද එසේ එය ක්‍රියාත්මක නොවීය. ඉන් අනතුරුව 2008 වර්ෂයේ නොවැම්බර් 17 වන දින මෙම වැඩසටහන බස්නාහිර පළාතේ ක්‍රියාත්මක කිරීමත් සමඟ සියළුම පළාත් ආවරණය කරමින් මේ වන විට ක්‍රියාත්මක කර ඇත.

2008 ජනවාරි මස 25 දින නිකුත් කරන ලද අංක 1533/17 දරන අති විශේෂ ගැසට් නියෝගයත්, 2009 අංක 08 මෝටර් වාහන (සංශෝධන) පනත හා අංක1557/14 ජාතික පරිසර (වායු විමෝචන ඉන්ධන හා වාහන ආනයන ප්‍රමිති) අති විශේෂ ගැසට් පත්‍රය අනුව 2008 නොවැම්බර් මස 17 දින සිට ක්‍රියාත්මක වන පරිදි වායු විමෝචන පරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී.

### 1.1 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ වායු විමෝචන රෙගුලාසි

- 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ 2000 වර්ෂයේ GE /1137/35 යටතේ අදාළ රෙගුලාසි ප්‍රකාශයට පත් කළ අතර මෙම රෙගුලාසි 2003 ජූනි මස 30 දිනැති අංක 1295/11 දරන අති විශේෂ ගැසට් නිවේදනය මඟින් නැවතත් සංශෝධනය කරන ලදී.
- නැවත සංශෝධිත 2008 ජූලි 09 දිනැති අංක 1557/14 දරණ අති විශේෂ ගැසට් පත්‍රය.
- සියලු පාර්ශවකරුවන්ගේ එකඟතාවය මත සියලු වාහන සඳහා දැනට භාවිතා වන අංක 1557/14 ජාතික පරිසර (වායු විමෝචන ඉන්ධන හා වාහන ආනයන ප්‍රමිති ) අති විශේෂ ගැසට් පත්‍රය අනුව නව ප්‍රමිති හා රෙගුලාසි අංක 1887/20 හරහා 2014.11.05 දින සිට ප්‍රකාශයට පත් කරන ලදී.
- එසේම එහි සංශෝධනයක් අංක 1895/43 අති විශේෂ ගැසට් පත්‍රය 2015.01.02 පරිසර අමාත්‍යාංශය මඟින් ප්‍රකාශයට පත් කර ඇති අතර එහි නීතිමය පසුබිම පිළිබඳ සාකච්ජා කිරීමෙන් පසුව වාහන නියැදියක් නව ප්‍රමිතීන්ට අනුව අධීක්ෂණය කිරීමට කටයුතු කරන ලදී. එම නිරීක්ෂණ අනුව ප්‍රකාශිත ගැසට් පත්‍රය 2016.09.15 දින සිට රට පුරා ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදන ලදී.

### 1.2. වායු විමෝචන ප්‍රමිති ක්‍රියාත්මක කිරීම සඳහා මෝටර් වාහන පනතේ ඇති නීතිමය විධිවිධාන

මෝටර් රථ වාහන පනතේ ඇති රෙගුලාසි ඔස්සේ ඕනෑම මෝටර් රථයක වායු විමෝචන මට්ටම් පරීක්ෂා කිරීම හා සහතික කිරීම සඳහා බලයලත් මධ්‍යස්ථාන සඳහා බලය පැවරීම සඳහා මෝටර් රථ වාහන කොමසාරිස් ජනරාල් විසින් වාහන වායු විමෝචන ප්‍රමිති ක්‍රියාත්මක කිරීමේ වගකීම දරණ අතර එම ක්‍රියාකාරම් ක්‍රියාත්මක කිරීම සඳහා 1981 අංක 21 දරණ මෝටර් රථ ප්‍රවාහන පනතේ බලතල ලබා දී තිබේ.

- මෝටර් රථ ප්‍රවාහන පනතේ 29 වන වගන්තිය - ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා යෝග්‍යතා හා විමෝචන සහතිකයක් නිකුත් කිරීම සහ පවත්නා පන්තිවලට අමතරව වෙනත් ඕනෑම පන්තියක් සඳහා සහතික දෙකම එකවර ඒකාබද්ධ කිරීම.
- මෝටර් රථ ප්‍රවාහන පනතේ 19 සහ 155 A වන වගන්ති - විමෝචන ප්‍රමිතීන් සඳහා ප්‍රතිපාදන.
- මෝටර් රථ ප්‍රවාහන පනතේ 194 වගන්තිය - ඕනෑම වාහනයක් පරීක්ෂා කිරීම සඳහා මෝටර් රථ කොමසාරිස් ජනරාල් වෙත බලතල ලබා දී තිබීම.
- මෝටර් රථ ප්‍රවාහන පනතේ 195 සහ 196 වගන්ති - වායු විමෝචන මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම හා වායු විමෝචන සහතික නිකුත් කිරීම.
- මෝටර් රථ ප්‍රවාහන පනතේ 198 වගන්තිය - මාර්ගස්ථ රථ වාහන පරීක්ෂා කිරීම සඳහා විධිවිධාන.
- මෝටර් රථ ප්‍රවාහන පනතේ 218 A වන වගන්තිය - රථ වාහන රක්ෂණ, වායු විමෝචන සහ යෝග්‍යතා සහතික කිරීම් රහිතව රිය පැදවීම් සඳහා දඩ මුදල් අය කිරීම හෝ සිරගත කිරීම.
- 2008.01.25 වන දින ප්‍රකාශිත මෝටර් රථ ප්‍රවාහන පනතේ අති විශේෂ ගැසට් අංක 1533/17 දරණ - වායු විමෝචන පරීක්ෂණ නිරීක්ෂණය සහ සහතික කිරීම.

## 2. වාහන ගහණය හා වාහන වායු විමෝචන ප්‍රමිතීන්

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන ලියාපදිංචි දත්ත අනුව වසර ගණනාවක් පුරා මෙරට මෝටර් රථ ගහනය සීඝ්‍ර ලෙස වැඩිවීමක් ඇති අතර ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ වායු දූෂණය පිළිබඳ ගැටළුව සඳහා පහත කරුණු හේතු පාදක වී තිබේ.

- වාහනවල දුර්වල නඩත්තු කිරීම නිසා ඩීසල් හා පෙට්‍රල් වාහන වලින් විමෝචනය වන කාබන් මොනොක්සයිඩ් හා වාෂ්පශීලී කාබනික සංයෝග වායු දූෂණය වැඩි කරයි.
- විධිමත් මහා මාර්ග ජාලයක්, රථවාහන පාලනය කිරීම සහ මාර්ග නිසියාකාරව නඩත්තු නොකිරීම (විශේෂයෙන් නාගරික ප්‍රදේශ) හේතුවෙන් වාහන තදබදය වැඩි වීම.
- විධිමත් හා හොඳින් සැලසුම් කළ පොදු ප්‍රවාහන පද්ධතියක් නොමැතිවීම.




රූපය 1 : 2004 සිට 2017 දක්වා වාහන නව ලියාපදිංචි වීම් (මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව)

නාගරික හා අර්ධ නාගරික පෙදෙස් තුළ ඇතිවන වායු දූෂණය පිළිබද විශ්ලේෂණාත්මක ලෙස විවිධ පාර්ශවකරුවන්ගේ සහය ඇතිව කරුණු හඳුනා ගැනීමෙන් පසු වායු දූෂණය අවම කිරීම සඳහා වාහන වායු විමෝචන වැඩසටහන හඳුන්වාදීමත් දැනට භාවිතා කරන වාහන සඳහා පහත සඳහන් ප්‍රමිතීන් හඳුන්වා දීමත් සිදු කරනු ලැබිය.

### 2.1 දැනට ක්‍රියාත්මකව පවතින වාහන ප්‍රමිතීන්

| වාහන වර්ගය | කාබන මොනොක්සයිඩ් CO (%v/v)* | හයිඩොකාබන් HC (ppm %v/v)* | වෙනත් කරුණු |
|---|---|---|---|
| පෙට්‍රල් මෝටර් සයිකල් හා ට්‍රයිසිකල් හැර වෙනත් පෙට්‍රල් වාහන | 3 | 1000 | පණ ගන්වා ධාවනය නොකර 2500 RPM බර නොපටවා |
| පෙට්‍රල් මෝටර් සයිකල් හා ට්‍රයිසිකල් | 4 | 6000 | පණ ගන්වා ධාවනය නොකර 2500 RPM බර නොපටවා |

වගුව 1 : පෙට්‍රල් වාහන සඳහා ප්‍රමිතීන් (වායු විමෝචන, ඉන්ධන හා වාහන ආනයන ප්‍රමිති)

* සංක්ෂිප්ත ලකුණු

- (%v/v) - පරිමාවට අනුව ප්‍රතිශතය
- (ppm %v/v) - පරිමාවට අනුව මිලියනයකට කොටස්
- RPM - මිනිත්තුවට වට

| වාහන වර්ගය | ක්ෂණික ත්වරණයේදී විමෝචන ප්‍රමිතිය ධූම පාරාන්ධතාවය k සාධකය ($lm^{-1}$) 2014 * |
|---|---|
| ඩීසල් වාහන | 4.0 |

වගුව 1
පෙට්‍රල් වාහන සඳහා ප්‍රමිතීන් (වායු විමෝචන, ඉන්ධන හා වාහන ආනයන ප්‍රමිති)

* සංක්ෂිප්ත ලකුණු

- k සාධකය - අවශෝෂක සංගුණකය
- ක්ෂණික ත්වරණය - SAE Recommended Practice J 1667 යන යෙදුමෙහි අර්ථකථනයෙහි ඇති අර්ථයම ඇත.

## 3. වාහන පරීක්ෂා කිරීම සහ නඩත්තු වැඩසටහන සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකාව තුළ නාගරික වායු තත්ත්ව කළමනාකරණය පිළිබඳ වාර්තාවේ සඳහන් වන පරිදි වාහන වායු විමෝචන අඩු කිරීමේ සංරචක වන "වාහන පරීක්ෂා කිරීම සහ නඩත්තු කිරීම" යටතේ වාහන වායු විමෝචන වැඩසටහන අයත් වේ. වාහනයේ කාර්මික පද්ධතීන්වල ක්‍රියාකාරිත්වය, වායු විමෝචන ප්‍රමිති, පරීක්ෂණ ක්‍රියාපටිපාටි, මාර්ගස්ථ පරීක්ෂාව, ප්‍රගති සමාලෝචනය, වැඩසටහනේ අධීක්ෂණ සහ නියාමන කටයුතු කිරීම සඳහා මෙම වැඩසටහන සැලසුම් කර ඇත.

ජාතික පාරිසරික පනතේ රෙගුලාසි හා බැදෙන මෝටර් රථ වාහන පනත, ඒ හා අදාළ සංශෝධන, අදාළ කැබිනට් පත්‍රිකා සහ පරිසරය සම්බන්ධයෙන් කටයුතු කරන අනෙකුත් නීති සංග්‍රහයන් හා සංශෝධන, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට පරිසර අමාත්‍යංශය, මධ්‍යම පරිසර අධිකාරිය, ප්‍රවාහන අමාත්‍යංශය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත බලතල පැවරී තිබේ. එසේම පරිසර ආමාත්‍යාංශයේ වායු සම්පත් කළමනාකරණ කේන්ද්‍රය පිහිටුවීමත් සමඟ මෙම නියාමන කාර්යය ආරම්භ කිරීම සඳහා ප්‍රධාන පාර්ශවකරුවන් ප්‍රමිති සකස් කිරීමට රැස්වීම්, සමීක්ෂණ, වැඩමුළු සහ සාකච්ඡා පැවැත්විය.

වායු විමෝචන වැඩසටහන වාහනවල වාර්ෂික ආදායම් බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාපටිපාටිය හරහා ක්‍රියාත්මක වන අතර වාර්ෂික ආදායම් බලපත්‍රය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරනු ලැබේ. එබැවින්, මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට පෙර මෙම වැඩසටහන පිළිබඳව පූර්ව පුහුණුවීම් ලබාදීම ද සිදු කළ අතර මෙම වැඩසටහනට අදාළ වන තාක්ෂණික දැනුම ලබා දීම සිදු කරන ලදී.

## 4. වර්තමාන තත්ත්වය

"ශ්‍රී ලංකාවේ නාගරික වායු තත්ත්ව කළමනාකරණය" පිළිබඳ අවසාන වාර්තාවේ නිර්දේශ මත පදනම්ව "යෝජනා ඉදිරිපත් කිරීමේ ලියවිල්ල (Request For Proposal)" 2003 සැප්තැම්බර් 15 වන දින පෞද්ගලික ආයෝජකයන්ට "ලංසු කැඳවීම්" දැන්වීමක් ලෙස නිකුත් කරන ලදී. මෙම වැඩසටහනේ සියලු සැලසුම් විස්තර, විධික්‍රම, පරීක්ෂණ ක්‍රියාපටිපාටි, දත්ත කළමනාකරණය සහ පරීක්ෂණ විධිවිධාන අඩංගු විය.

රජය සහ පෞද්ගලික හවුල්කාරිත්වයක් ලෙස මෙම වැඩසටහන සැලසුම් කර ඇති අතර පෞද්ගලික සමාගම් දෙකක මධ්‍යගත පද්ධතියක් ලෙස ලාෆ් ඉකෝ ශ්‍රී (පුද්.) සමාගම සහ ක්ලින්කෝ ලංකා (පුද්.) සමාගම මඟින් අදාළ වායු විමෝචන මධ්‍යස්ථාන ස්ථාපිත කර වාහන වායු විමෝචන පරීක්ෂා කිරීම මඟින් අදාළ සහතික නිකුත් කිරීම සිදු කරනු ලබයි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට ඉදිරිපත් කරන ලද යෝජනා 12 ක් ඇගයීමට ලක් කිරීමෙන් පසු වර්තමාන ආයතන 2 තෝරා ගන්නා ලද අතර සියලුම පළාත් ආවරණය වන ලෙස මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම ඔවුන් විසින් සිදු කළ යුතු කාර්යයක් විය.

2008 නොවැම්බර් 17 දිනෙන් බස්නාහිර පළාතෙන් ආරම්භ වූ මෙම වැඩසටහන 2013 ජුනි 03 වන විට උතුරු පළාත ද ආවරණය කරමින් ක්‍රියාත්මක වන අතර, මේ වන විට දිවයින පුරා ක්‍රියාත්මක වෙමින් පවතී.

- 2008.11.17 - බස්නාහිර පළාතේ ක්‍රියාත්මක කිරීම
- 2009.06.22 - මධ්‍යම, දකුණු සහ උතුරු මැද පළාත්වල ක්‍රියාත්මක කිරීම
- 2009.12.15 - ඌව, සබරගමුව හා වයඹ පළාත්වල ක්‍රියාත්මක කිරීම
- 2011.07.01 - නැගෙනහිර පළාත තුළ ක්‍රියාත්මක කිරීම
- 2013.06.03 - උතුරු පළාත තුළ ක්‍රියාත්මක කිරීම




| | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| සිදු කරන ලද මුළු පරීක්ෂණ ගණන | 109,289 | 1,089,852 | 1,877,745 | 2,490,432 | 2,810,652 | 3,546,197 | 3,853,340 | 4,328,540 | 5,225,081 | 5,535,148 |
| කරන ලද මූලික පරීක්ෂා ගණන | 99,383 | 947,167 | 1,612,791 | 2,131,808 | 2,362,803 | 3,029,406 | 3,328,873 | 3,741,176 | 4,230,391 | 4,552,641 |
| පළමු හා පිළිසකර කිරීමෙන් පසුව සමත් වූ ගණන | 95,419 | 903,097 | 1,563,295 | 2,097,415 | 2,323,563 | 2,991,568 | 3,292,765 | 3,695,061 | 4,142,516 | 4,422,422 |
| පරීක්ෂණයෙන් පූර්ණ වශයෙන් අසමත් ගණන | 13,870 | 186,755 | 314,450 | 393,017 | 487,089 | 554,629 | 560,575 | 633,479 | 1,082,565 | 1,575,936 |

රූපය 2 : 2008 - 2017 දක්වා වාහන වායු විමෝචන වැඩසටහනේ පරීක්ෂණ වල ව්‍යාප්තිය
(වාහන වායු විමෝචන ව්‍යාපෘති කාර්යාලය)

දිනෙන් දින වාහන ගහනය වැඩිවීමත් සමඟ වාහන පරීක්ෂණ සංඛ්‍යා ද වර්ෂයක් පාසා ඉහළයන අතර මේ වන විට මිලියන 5.5 ක වායු විමෝචන පරීක්ෂණ සංඛ්‍යාවක් 2017 (රූපය 2 අනුව) වසර වන විට සිදු කර තිබේ. සියලුම නව වාහන ආදායම් බලපත්‍ර ලබා ගැනීම සඳහා වසරක් සඳහා නිදහස් කරනු ලබන අතර වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා ගැනීම සඳහා වායු විමෝචන සහතිකය ලබා ගැනීම දෙවන වර සිට අනිවාර්ය වේ. එසේම වාහන වායු විමෝචන සහතික ලබා ගැනීමෙන් 1975.12.31 දිනට පෙර නිෂ්පාදනය කරන ලද වාහන, සියලුම කෘෂිකාර්මික ඉඩම් වාහන, විදුලි හා දෙමුහුන් වාහන නිදහස් කර ඇත.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන ආයතනය ලෙස මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව කටයුතු කරන අතර අධීක්ෂණය හා ඇගයුම් කටයුතු සිදු කරනු ලබන්නේ වාහන වායු විමෝචන ව්‍යාපෘති කාර්යාලය හා පරිසර අමාත්‍යංශයේ වායු සම්පත් කළමනාකරණ කේන්ද්‍රය මගිනි. එසේම මධ්‍යස්ථාන වල පරීක්ෂණ උපකරණ සත්‍යාපනය කිරීම සඳහා මිනුම් ඒකක හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහය ලබාගනී.

වර්තමානයේ මෙම සමාගම් දෙක සතුව ස්ථාවර මධ්‍යස්ථාන 36ක්, අර්ධ ස්ථාවර ස්ථාන 146ක් සහ ජංගම සේවා ස්ථාන 251ක් පළාත් 9ක් ආවරණය වන පරිදි දිවයින පුරා ස්ථාන 431ක කටයුතු කරනු ලබයි. ස්ථාවර, අර්ධ ස්ථාවර සහ ජංගම මධ්‍යස්ථාන වල විස්තර පහත පරිදි වේ.

| | ස්ථාවර | අර්ධ - ස්ථාවර | ජංගම | මුළු මධස්ථාන ප්‍රමාණයන් |
|---|---|---|---|---|
| ක්ලින්කෝ ලංකා | 15 | 78 | 118 | 211 |
| ලාෆ් එකෝ ශ්‍රී ආයතනය | 19 | 68 | 133 | 220 |
| මුළු මධ්‍යස්ථාන ප්‍රමාණයන් | 36 | 146 | 251 | 431 |

වගුව 3 : මධ්‍යස්ථාන ප්‍රමාණයන් (වාහන වායු විමෝචන ව්‍යාපෘති කාර්යාලය)

## 4. පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය

වාහන වායු විමෝචන මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම, මාර්ගස්ථ දුම් පරීක්ෂණ වැඩසටහන සහ ස්ථානීය දුම් පරීක්ෂණ වැඩසටහන හරහා මහජනතාව දැනුවත් කිරීම මඟින් පරීක්ෂණ සහ අධීක්ෂණ කටයුතු සිදු කරනු ලැබේ. වාහන වායු විමෝචන ව්‍යාපෘති කාර්යාලීය නිලධාරීන්, මෝටර් රථ ප්‍රවාහන නිලධාරීන්, වායු සම්පත් කළමනාකරණ කේන්ද්‍රයේ නිලධාරීන් හා මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් සමඟ එක්ව මෙම වැඩසටහන් අඛණ්ඩව සිදුකරමින් පවතී.



රූපය 3 : වාහන වායු විමෝචන මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම



රූපය 4 : මාර්ගස්ථ වායු විමෝචන වැඩසටහන

යෝජනා කැඳවීමේ ලියවිල්ලට අනුකූලවන ස්ථාවර හා ජංගම වාහන වායු විමෝචන මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම පිළිබඳව තත්ත්ව පරීක්ෂාව හා නියාමනය කිරීම සිදු කරනු ලබන අතර එම මධ්‍යස්ථානවල සිදුවන අක්‍රමිකතා හඳුනා ගැනීමට හා ඒවාට නිසි විගණන පරීක්ෂණ පවත්වා උචිත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු යොදා ඇත.

එසේම මාර්ගස්ථ වායු විමෝචන වැඩසටහන ඔස්සේ අහඹු ලෙස වාහන පරීක්ෂාව සිදු කරන අතර එමගින් අඛණ්ඩව වාහන නඩත්තු කිරීම පිළිබඳව වාහන හිමියන් දිරිගැන්වීම හා ඔවුන් දැනුවත් කිරීමේ කාර්ය වායු විමෝචන ව්‍යාපෘති කාර්යාල නිලධාරීන්, වායු සම්පත් කළමනාකරණ කේන්ද්‍ර නිලධාරීන් හා පොලිස් නිලධාරීන්ගේ සහය සමඟ සිදු කරනු ලබයි.




රූපය 5 : ස්ථානීය දුම් පරීක්ෂණ වැඩසටහන ඔස්සේ හඳුනාගත් වාහනයක්

අධික ලෙස දුම් පිටවන වාහන හඳුනාගැනීම් සඳහා ස්ථානීය දුම් පරීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර එහිදී හඳුනාගත් වාහනවල ඡායාරූප ගත කර එම වාහන දත්ත ඔස්සේ එම වාහන පරීක්ෂා කිරීම සිදු කරනු ලබයි.

## 5. ඉදිරි දැක්ම

වාහන වායු විමෝචන වැඩසටහන, පිරිසිදු වායු 2025 ක්‍රියාකාරී සැලැස්ම යටතේ වාහන පරීක්ෂා කිරීමේ නව පරීක්ෂණ ක්‍රම හඳුන්වා දීම, ප්‍රවාහනය සඳහා සුපිරිසිදු ඉන්ධන තත්ත්ව නඩත්තු කිරීම හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, සංසරණ වායු තත්ත්වයේ ගුණාත්මකභාවය පිළිබඳව තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම, ඵලදායී ලෙස වායු තත්ත්ව කළමණාකරණය සඳහා තොරතුරු මූලික දැනුම සහ මානව සම්පත් සංවර්ධනය, වායු ගුණාත්මක තත්ත්වය පිළිබඳව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඇතුළත්ව තිබේ.

වායු විමෝචනය අවම කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා දේශීය විමෝචන දත්ත ගබඩා සංවර්ධනය කිරීම මඟින් ප්‍රවාහන සැලසුම් සහ ව්‍යාපෘති ප්‍රමාණකරණය සඳහා වායු විමෝචන පර්යේෂණ දත්ත හා ඇස්තමේන්තු යොදාගත හැකිය. ඉන්ධන සහ දහන තාක්ෂණයන් වෙනස්වීමෙන් ඇතිවන සංසිද්ධියෙහි ගතික ස්වභාවය නිසා වාහන සංචිතයේ ප්‍රමාණය හා ඒවා පිළිබඳ තොරතුරු අඛණ්ඩව යාවත්කාලීන කළ යුතු වේ. එසේම, ශ්‍රී ලංකාව 2016 දී දේශගුණ විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුමට අත්සන් තැබීම සහ පැරිස් සම්මුතියේ පාර්ශව රාජ්‍යයක් වශයෙන් ශ්‍රී ලංකාව අපේක්ෂිත දේශියව තීරණය කරන ලද දායකත්ව (Intended Nationally Determined Contributions) සඳහා එකඟතාවය ඵල කර ඇති අතර ඒ තුළින් ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වාහන වායු දූෂණය අවම කිරීමේ විශාල කාර්යභාරයක් වාහන වායු විමෝචන වැඩසටහනට පැවරී තිබේ.



මෙම කාර්යභාරයන් සමඟ නව තාක්ෂණික ක්‍රම, නව වායු විමෝචන ප්‍රමිතීන්, උපායමාර්ග උපයෝගී කරගනිමින් සාර්ථක නියාමන වැඩසටහනක් ලෙස මෙරට හිතකර වායු තත්ත්වයක් නිර්මාණය කිරීමේ ජාතික මෙහෙවරට වාහන වායු විමෝචන වැඩසටහන විශාල දායකත්වයක් දක්වයි.

මූලාශ්‍ර:


1. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත, අති විශේෂ ගැසට් පත්‍ර අංක 850/04, 1994
2. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත, අති විශේෂ ගැසට් පත්‍ර අංක 1137/35, 2000
3. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත, අති විශේෂ ගැසට් පත්‍ර අංක 1295/11, 2003
4. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත, අති විශේෂ ගැසට් පත්‍ර අංක 1557/14 - 09.07. 2008
5. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත, අති විශේෂ ගැසට් පත්‍ර අංක 1887/20, 05.11.2014
6. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත, අති විශේෂ ගැසට් පත්‍ර අංක 1895/43, 02.01.2015
7. මෝටර් රථ වාහන පනත හා එහි සංශෝධන
8. මෝටර් රථ ප්‍රවාහන පනතේ අති විශේෂ ගැසට් අංක 1533/17, 2008.01.25
9. නාගරික වායු තත්ත්ව කළමනාකරණ වාර්තාව 2004 වායු සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය, පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යංශය
10. ලෝක සෞඛ්‍ය සංවිධානය, පරිසරය (එළිමහන්) වාතයෙහි ගුණාත්මක භාවය සහ සෞඛ්‍ය, මාධ්‍ය මධ්‍යස්ථානය, කරුණු පත්‍රිකාව හා N°313, මාර්තු 2014, [Online] Available (http///www.who.int/mediacentre/factsheets/fs313/en/
   කේ. ශ්‍රේෂ්ඨා, ශ්‍රී ලංකා වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන (Study of Sri Lanka Vehicle Emission Testing (VET) Programme) 2012, වායු සම්පත් කළමනාකරණ කේන්ද්‍රය / පිරිසිදු වායු ශ්‍රී ලංකා හා මොරටුව විශ්ව විද්‍යාලය සමඟ සහයෝගීතාවයෙන්



CLEAN AIR 2025

An Action Plan for Air Quality Management

Ministry of Mahaweli Development & Environment

May 2016


ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

1980 අංක 47 ජාතික පාරිසරික පනත